# ජාතික ගිණුම් සැකසීම
# National Accounting

Dr. P.D.C.S. Dharmadasa

Senior Lecturer

Department of Economics

University of Kelaniya

# ජාතික ආදායම් ගිණුම්කරණය
# (National Income Accounting)

- ජාතික ආදායම් ගිණුම්කරණය යනු යම් කාල සීමාවක් තුළ රටේ ආර්ථික ක්‍රියාකාරකම් මට්ටම මැනීමට රජයක් භාවිතා කරන පොත් තැබීමේ ක්‍රමයකි. මේ ආකාරයේ ගිණුම් වාර්තාවලට ගෘහාශ්‍රිත සංස්ථා ඉපැයූ මුළු ආදායම, විදේශීය සහ දේශීය ගෘහ සේවිකාවන්ට ගෙවන වැටුප්, සහ රට තුළ ඇති සංස්ථා සහ රටෙහි වෙසෙන පුද්ගලයන් විසින් විකුණුම් සහ ආදායම් බදු සඳහා වැය කරන ලද ප්‍රමාණය පිළිබඳ දත්ත ඇතුළත් වේ.

# සංකල්ප (Concepts)

**දළ දේශීය නිෂ්පාදිතය** (Gross Domestic Product - GDP)

- දළ දේශීය නිෂ්පාදිතය යනු නිශ්චිත කාල සීමාවක් තුළ රටක දේශසීමා තුළ නිෂ්පාදනය කරන ලද සියලුම නිමි භාණ්ඩ සහ සේවාවන්හි සම්පූර්ණ මුදල් හෝ වෙළඳපල වටිනාකමයි

- ගිණුම්කරණයේදී **තොග** සහ **ප්‍රවාහ** වශයෙන් කොටස් දෙකකි. තොග (stock) ක්‍රමයට සිදුකරන ගණනයන් වලදී ප්‍රාග්ධන තොගය ඉඩම් ප්‍රමාණ, වත්කම් ආදී දෑ ඇතුලත් වන අතර මෙය යම්කිසි කාල පරිච්ඡේදයක් අවසානයේදී සිදුකරනු ලබයි

- ප්‍රවාහ (flow) ක්‍රමයට සිදු කෙරෙන ගණනයන් කාලයක් තුළ නිමැවුමෙහි මුදල් අගය ගණනය කරයි. ඒ අනුව **දළ දේශීය නිෂ්පාදිතය ප්‍රවාහ ක්‍රමයට සිදු කෙරෙන ගණනය කිරීම් යටතට අයත් වේ**

## දළ ජාතික ආදායම (Gross National Income - GNI)

- දළ ජාතික ආදායම (GNI) යනු ජාතියක (රටක) ජනතාව සහ ව්‍යාපාර විසින් උපයන මුළු මුදල් ප්‍රමාණයයි
- එසේම එම රට විදේශ සම්පත් උපයෝගී කරගෙන මෙරට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරයි නම් සහ විදේශ රටක් මෙරට සම්පත් උපයෝගී කරගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරයි නම් ඒ සඳහා කරනු ලබන සාධක ගෙවීම් සහ ලැබීම් වල වෙනස එනම් විදේශ ශුද්ධ සාධක ආදායම ද මෙයට ඇතුලත් වේ.

**දළ ජාතික ආදායම = දළ දේශීය නිෂ්පාදිතය + විදේශ ශුද්ධ සාධක ආදායම**

- **විදේශ ශුද්ධ සාධක ආදායම (-) – GDP>GNI**
- **විදේශ ශුද්ධ සාධක ආදායම (+) – GNI>GDP**

**ශුද්ධ ප්‍රාථමික ආදායම (Net Primary Income)**

අනේවාසික සේවකයින්ට ගෙවන ලද සේවක වන්දි ගෙවීම් සහ ආයෝජන ආදායම (සෘජු ආයෝජන, කළඹ ආයෝජන, වෙනත් ආයෝජන සහ සංචිත වත්කම් මත ලැබීම් සහ ගෙවීම්)

**ද්විතික ආදායම (Secondary Income)**

මූර්ත හෝ මූල්‍යමය සම්පත් හිමිකාරිත්වය මාරු කිරීම හරහා අනේවාසිකයින්ගෙන් ලැබුණු හෝ අනේවාසිකයින්ට ගෙවන ලද පරිත්‍යාගයක් හෝ ප්‍රදානයක්

## දළ සහ ශුද්ධ සංකල්පය (Gross & Net Concepts)

ප්‍රාග්ධන පරිභෝජනය සඳහා කිසිදු දීමනාවක් ලබා දී නොමැති බව හෝ ක්ෂයවීම් තවමත් අඩු කර නොමැති බව දළ සංකල්පයෙන් අවධාරණය කරයි

ප්‍රාග්ධන පරිභෝජනය සඳහා ප්‍රතිපාදන දැනටමත් සිදු කර ඇති බව හෝ ක්ෂයවීම් දැනටමත් අඩු කර ඇති බව ශුද්ධ සංකල්පයෙන් පෙන්නුම් කරයි

**ශුද්ධ ජාතික ආදායම (NNI) = GNI - ප්‍රාග්ධන ක්ෂය වීම**

උදා:

- A රට වසරක් තුළ ඩොලර් ට්‍රිලියන 1 ක් වටිනා භාණ්ඩ සහ ඩොලර් ට්‍රිලියන 3 ක් වටිනා සේවා නිෂ්පාදනය කරයි. සාමූහිකව, භාණ්ඩ හා සේවා මුළු ඩොලර් ට්‍රිලියන 4 කි. එය තමයි දළ ජාතික නිෂ්පාදනයි නමුත්, එම භාණ්ඩ හා සේවා නිර්මාණය කිරීමට භාවිතා කරන වත්කම් ඩොලර් බිලියන 500කින් ක්ෂය වේ

**NNI ඩොලර් ට්‍රිලියන 3.5 = (GDP) ඩොලර් ට්‍රිලියන 4 - ඩොලර් ට්‍රිලියන 0.5 (ක්ෂය වීම)**

## වැයකළ හැකි ආදායම (Disposable income)

- වැයකළ හැකි ආදායම යනු පුද්ගලයන්ට අවශ්‍ය පරිදි වියදම් කිරීම සඳහා සැබවින්ම ඉතිරිව ඇති මුළු ආදායමයි. පුද්ගලයන් විසින් ගෙවනු ලබන සෘජු බදු ප්‍රමාණය අනුව එය පුද්ගලික ආදායමෙන් වෙනස් වේ.


**වැයකළ හැකි ආදායම = (පුද්ගලික ආදායම - පුද්ගලික බදු) + සංක්‍රාම ලැබීම්**

## ප්‍රාග්ධන සම්පාදනය (ආයෝජනය) (Investment)

යම්කිසි ආර්ථිකයක භාණ්ඩ හා සේවා නිපදවීම අඛණ්ඩව පවත්වා ගැනීම සහ නිෂ්පාදන හැකියාව වර්ධනය කරගැනීමට අලුතින් ප්‍රාග්ධනය ඒකරාශී කරගත යුතුය. ඒ අනුව, පවතින ප්‍රාග්ධන ප්‍රමාණයට අලුතින් එකතුකරගන්න ප්‍රාග්ධන ප්‍රමාණය ප්‍රාග්ධන සම්පාදනය ලෙස සැලකේ. මෙහි කොටස් දෙකකි.

1 දළ දේශීය ආයෝජනය

2. ශුද්ධ විදේශ ආයෝජන


ප්‍රාග්ධන සම්පාදනය
දළ දේශීය ආයෝජනය
ශුද්ධ විදේශ ආයෝජන
දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය
තොග වෙනස්වීම්
ජංගම ගිණුමේ ශුද්ධ ශේෂය

## ආර්ථික ප්‍රදේශය (Economic Area)

- ආණ්ඩුවක පලදායී ආර්ථික පාලනයක් යටතේ පවතින ප්‍රදේශයක් ආර්ථික ප්‍රදේශයක් ලෙස නිර්වචනය කරනු ලැබේ. මේ තුල පුද්ගලයන්, භාණ්ඩ සහ ප්‍රාග්ධනය නිදහසේ සංචලනය කල හැක.

## නේවාසික ආර්ථිකය ඒකක (Residential Economic Units)

- නේවාසික ආර්ථිකය ඒකකයක් යනු ආර්ථික දේශ සීමාවේ තුළ වසරකට නොඅඩු කාලයක් ආර්ථික කටයුතු සිදුකෙරෙන හෝ එසේ කිරීමට අභිලාෂයක් ඇති ආර්ථික ඒකකයකි. නේවාසික ආර්ථික ඒකකයක් යන්න සාමාන්‍ය මිනිසුන්ගේ ගෘහ ඒකක හෝ ආයතනයනේගෙන් සමන්විත වේ.

## ශ්‍රී ලංකාවේ නේවාසික කුටුම්බ (Residential Households in Sri Lanka)

- වසරකට නොඅඩු කාලයක් විදේශ සේවයේ නියුතු ශ්‍රී ලාංකික සේවකයින්
- වසරකට නොඅඩු කාලයක් විදේශගතව ජීවත් වන හෝ සේවය කරන ශ්‍රී ලාංකික නිලධාරීන්, ව්‍යාපාරිකයින්, කලාකරුවන් සහ සංචාරකයින්
- ශ්‍රී ලාංකික ජංගම යානා වල කාර්ය මණ්ඩල සාමාජිකයින්
- අධයයන කාල පරාසය නොසලකමින් විදේශීය අධ්‍යාපනයේ යෙදෙන ශ්‍රී ලාංකික ශිෂයන්
- ශ්‍රී ලංකාවේ ස්ථාපිත විදේශීය තානාපති කාර්යාල, කොන්සෝල් කාර්යාල වල සේවය කිරීමට බඳවාගත් දේශීය සේවකයින්
- ශ්‍රී ලංකාදේ ස්ථාපිත ජාත්‍යන්තර සංවිධාන හෝ බහුජාතික සංවිධානයන් හි ශ්‍රී ලාංකික කාර්ය මණ්ඩලය

## ආයතනික ඒකක (Institutional Units)

- වත්කම් හිමිකර ගැනීම වගකීම් දැරීම ආර්ථික ක්‍රියාකාරකම් වල නිරත වීම සහ සෙසු ඒකක සමග ගනුදෙනුවලට සම්බන්ධ වීමට හැකියාව ඇති ආර්ථික ඒකකයක් ආයතනික ඒකකයක් වශයෙන් හඳුන්වනු ලැබේ.

ආර්ථික ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක වන ආයතනික ඒකක පස් වැදෑරුම් වේ

1. මූලය නොවන සමාගමික අංශය (Non - Financial Corporations sector)
2. මූලය සමාගමික අංශය (Financial Corporations sector)
3. රාජය අංශය (General Government)
4. ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන අංශය (Non-profit institutions serving Household sector)
5. ගෘහ ඒකක (කුටුම්බ අංශය) (Household sector)

**මූලය නොවන සමාගමික අංශය** (Non - Financial Corporations sector)

මෙම සමාගම් ඍජුවම මුල්‍ය සැපයීම සිදු නොකරයි

1. **රාජ්‍ය සමාගම්** - අඩු තරමේ කොටස් වලින් 50% වත් රාජ්‍ය අංශය සතු සමාගම් මේ යටතට අයත් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, ලංකා සතොස (පුද්ගලික) සමාගම, මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය, රාජ්‍ය දැව සංස්ථාව, කුරුණෑගල වැවිලි (පුද්ගලික) සමාගම, රාජ්‍ය ඖෂධ සංස්ථාව, මිල්කෝ (පුද්ගලික) සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය

2. **පෞද්ගලික සමාගම්** - හේමාස් හෝල්ඩින්ග්ස්, සන්ෂයින් හෝල්ඩින්ග්ස්, ලයන් බ්‍රෙවරි ආදිය

3. **විදේශ පාලනයට නතු සමාගම්** - ජුවලරි සමාගම් - වෝග් ආදිය, ජනසන්නිවේදන ආයතන (සිරස ආදිය)

**මූල්‍ය සමාගමික අංශය** (Financial Corporations sector)

1. **රාජ්‍ය සමාගම්** - ලංකා බැංකුව මහජන බැංකුව ජාතික ඉතිරිකිරීමෙ බැංකුව රාජ්‍ය උගස් හා ආයෝජන බැංකුව ආදිය

2. **පෞද්ගලික සමාගම්** - බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, ලීසිං සමාගම්

බලයලත් මූල්‍ය ආයතන | Central Bank of Sri Lanka (cbsl.gov.lk)

3. **විදේශ පාලනයට නතු සමාගම්** - බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (HSBC etc. ලීසිං සමාගම්

**රාජය අංශය** (General Government)

- රජයට අයත් වාණිජ සංස්ථා, රජය සතු සමාගම්, වතු සමාගම්, වෙනත් සියලු දෑ මෙයට අයත්ය

උදා: තැපැල් සේවය, දුම්රිය, රාජ්‍ය බැංකු ආදිය

List of government-owned companies of Sri Lanka - Wikipedia

**ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන අංශය**

(Non-profit institutions serving Household sector)

- මෙම ආයතන ප්‍රධාන වශයෙන් රජය විසින් මූල්‍යකරණය සහ පාලනය නොකරන අතර නොමිලේ හෝ ආර්ථික වශයෙන් වැදගත් නොවන මිල ගණන් යටතේ ගෘහ භාණ්ඩ හෝ සේවා සපයයි. උදාහරණ ලෙස පල්ලි සහ ආගමික සමිති, ක්‍රීඩා සහ වෙනත් සමාජ ශාලා, වෘත්තීය සමිති සහ දේශපාලන පක්ෂ ඇතුළත් වේ.

- NPISH යනු වෙනම නීතිමය ආයතන වන අතර පුද්ගලික, වෙළඳපල නොවන නිෂ්පාදකයින් වේ. ඔවුන්ගේ ප්‍රධාන සම්පත්, ඉඳහිට ලැබෙන විකුණුම් වලින් ලබා ගන්නා ඒවා හැර, පාරිභෝගිකයන් වශයෙන් ඔවුන්ගේ ධාරිතාවයෙන් කුටුම්භවලින් මුදල් හෝ ද්‍රව්‍ය වශයෙන් කෙරෙන ස්වේච්ඡා දායකත්වයෙන්, සාමාන්‍ය රජයන් විසින් කරන ලද ගෙවීම්වලින් සහ දේපල ආදායමෙන් ලබා ගනී

උදා සර්වෝදය

## නිෂ්පාදන ඉම (Production boundary)

- නිෂ්පාදන ඉම සංකල්පය භාවිතා කරන්නේ ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකම් සහ ආර්ථික නොවන නිෂ්පාදන ක්‍රියාකාරකම් වෙන්කර අර්ථ දැක්වීමටයි. එනම්, ඵලදායි ගනුදෙනු සහ ඵලදායී නොවන ගනුදෙනු වෙන්කිරීමටයි. ඵලදයී ගනුදෙනු යනු යම්කිසිස ඵලදයී ක්‍රියාවලියක් තවත් ඵලදයී ක්‍රියාවලියක් සඳහා යොදා ගැනීමට හැකි ගනුදෙනු වේ. **මෙම ගනුදෙනු වල විශේෂත්වය වන්නේ එකිනෙකට ප්‍රතිවිරුද්ද මූර්ත සහ මූල්‍ය ප්‍රවාහයන් දෙකක් සිදුවීමයි.** එසේ සිදු නොවන ක්‍රියාවන් ඵලදයී ගනුදෙනු යටතට අයත් නොවේ.

නිෂ්පාදන සීමාවට ඇතුළත් වන්නේ:

1. **වෙළඳ පොළ අරමුණු කොටගත් නිෂ්පාදනයන්**

ඔවුන්ගේ නිෂ්පාදකයින් හැර අනෙකුත් ඒකකවලට සපයනු ලබන හෝ එසේ සැපයීමට අදහස් කරන සියලුම තනි හෝ සාමූහික භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය, එම භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියේදී භාවිතා කරන භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය ඇතුළුව, ඔවුන්ගේ නිෂ්පාදකයින් හැර අනෙකුත් ඒකකවලට සපයනු ලබන හෝ එසේ සැපයීමට අදහස් කරන සියලුම තනි හෝ සාමූහික භාණ්ඩ හෝ සේවා නිෂ්පාදන

2. **වෙළඳ පොළ අරමුණු කොට නොගත් වෙනත් නිෂ්පාදනයන්**

තම අවසාන පරිභෝජනය හෝ දළ ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා ඔවුන්ගේ නිෂ්පාදකයින් විසින් රඳවා තබා ගන්නා සියලුම භාණ්ඩවල ස්වයං-ගිණුම් නිෂ්පාදන

3. **ගෘහ ආර්ථික ඒකක කටයුතු අයත් නිෂ්පාදනයන්**

හිමිකරුවන් විසින් නිවාස සේවා සහ ගෙවන ගෘහ සේවක සේවිකාවන් විසින් නිෂ්පාදනය කරන ලද ගෘහස්ත සහ පුද්ගලික සේවා ස්වයං-ගිණුම් නිෂ්පාදන

**ජාතික ගිණුම්කරණයේදී නිෂ්පාදනයේ ඉමට ඇතුළත් කළ යුතු නිෂ්පාදන (ආර්ථික) ක්‍රියාකාරකම්.**

- වෙළෙඳපොළේ විකිණෙන සියලුම භාණ්ඩ හා සේවාවන් නිෂ්පාදන ඉමට ඇතුළත් වේ.
- නිෂ්පාදනය කළ ආයතනයේ හැර සෙසු ආයතනික ඒකක සඳහා නිෂ්පාදනය කරන ලද සියලුම භාණ්ඩ හා සේවා
- තමාගෙන් අවසාන පරිභෝජනය සඳහා හෝ ප්‍රාග්ධන සම්පාදනය සඳහා හෝ නිෂ්පාදනය කොට ඒවායේ නිෂ්පාදකයන් විසින් තමන් වෙත රඳවා ගන්නා ලද සියලුම භාණ්ඩ
- තමන් සතුව ඇති තමන් පදිංචි වී සිටින නිවාස වලින් ලබාදෙන නේවාසික සේවය.
- වැටුප් ලබන සේවකයන් විසින් ඉටු කරනු ලබන ගෘහ සේවා සහ පෞද්ගලික සේවා
- තමන්ගේම පරිභෝජනය සඳහා කෘෂි බෝග නිෂ්පාදනය, ඒවා ගබඩා කොට තබා ගැනීම, වනාන්තරවලින් ආහාර බෝග ලබා ගැනීම හා පලතුරු රැස්කර ගැනීම, දර කැපීම සහ එකතු කිරීම, දඩයම් කිරීම සහ මසුන් අල්ලා ගැනීම.
- කෘෂි නිෂ්පාදන සැකසීම වී කොටා සකසා ගැනීගැනීම, පිටි කොටා ගැනීම, මස් මාළු කල්තබා ගැනීම සඳහා පිළියෙල කිරීම, පලතුරු බෝතල් කිරීම හා වියළා ගැනීම, කිරි මුදවා ගැනීම, කුඩා සහ පන් මලු විවීම, පැදුරු විවීම ආදිය.
- රෙදි විවීම ඇඳුම් මසා ගැනීම ගොතන ලද ඇඳුම් සහ තොප්පි ගෘහ භාණ්ඩ තනා ගැනීම.
- ජලය සපයා ගැනීම (කුඩා ඇළවල් දියාඇලි මගින් ජලය සපයා ගැනීම සඳහා කුඩා ව්‍යාපෘති සැකසීම)
- මත්ද්‍රව්‍ය මත්පැන් නීති විරෝධීව ආනයනය කරනු ලබන භාණ්ඩ ගණිකා සේවය, වැනි නීති විරෝධී දෑ අලෙවි කිරීම බෙදා හැරීම

- බදු ගෙවීමෙන් වැළකී සිටීම සමාජ ආරක්ෂණ දායක මුදල් ගෙවීමෙන් වැළකී සිටීම, නීතිමය ප්‍රමිතීන් පිළිපැදීමෙන් වැළකී සිටීම සඳහා උවමනාවෙන්ම බලධාරීන් ගෙන් වසන් කොට සිදු කරනු ලබන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය.
- වගා කරන ලද වනාන්තර වල ස්වභාවික වර්ධනය.
- විනෝදාත්මක සාහිත්‍යමය හා කලාත්මක නිර්මාණයන් ගේ මුල් පිටපත් නිෂ්පාදනය හා එම වත්කම් භාවිත කිරීම සඳහා අයිති කුලී පදනමකින් ලබාදීම.
- තමාගේම පාවිච්චියට වර්ෂයකට වැඩි කාලයක් සඳහා භාවිතයට ගත හැකි මෘදුකාංග නිර්මාණය කිරීම.
- ව්‍යවසායකයෙකු විසින් තමාගේ ප්‍රයෝජනය පිණිස කරනු ලබන පර්යේෂණ හා සංවර්ධන කටයුතු.
- මුදල් ණයට දෙන්නන් සහ උකස් කරුවන් තමාගේම අරමුදල් ණය වශයෙන් ලබා දෙමින් සිදු කරනු ලබන මූල්‍ය සේවා.
- ස්වභාවික සම්පතක් වූ ද පුද්ගලයකුගේ පාලනයට නතුවී නිෂ්පාදනයක් බිහිවන්නේ නම් නිෂ්පාදන ඉම ට අයත් වේ. (මත්ස්‍ය උද්‍යානයක ඇතිකරන මසුන්ගේ බෝවීම)
- නිරීක්ෂණය නොවන ආර්ථික කටයුතු ද ඇතුළත් විය යුතුය

  සැඟවුනු ආර්ථික කටයුතු,

  නීත්‍යානුකූල නොවන ආර්ථික කටයුතු.

දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොවන ඵලදායි කටයුතු

- ගෙවීමකින් තොරව නිවස තුළ ඉටු කරනු ලබන ගෘහ සේවය (නොගෙවූ ගෘහ සේවා)
- නොමිලේ ලැබෙන ස්වභාවික සම්පත් (භූමිය ජලය වාතය ආදී)
- මිනිස් ශ්‍රමයකින් තොරව වර්ධනය වන ස්වභාවික සම්පත් (වනාන්තර ආදිය)
- ඉගෙනීම හා විවේකය
- මිල වෙනස් වීම හෝ ස්වභාවික වර්ධනය හෝ මගින් සම්පත්වල සිදුවන වටිනාකම වෙනස් වීම.

ජාතික ගිණුම් සැකසීමේදී බැහැර කෙරෙන ඵලදායී නොවන ගනුදෙනු.

- සංක්‍රාම ,
- මුදල්මය පත්‍රිකා ආශ්‍රිත ගනුදෙනු,
- පාවිච්චි කළ භාණ්ඩ විකිණීම ආශ්‍රිත ගනුදෙනු

# මිල සංකල්පය (Concept of Price)

භාණ්ඩ හා සේවා සඳහා වෙළඳපොල තුල විවිධ මිල ගනන් පවතී.

1. භාණ්ඩ මත බදු අයකිරීම
2. භාණ්ඩ මත සහනාධාර ලබාදීම
3. තොග සහ සිල්ලර වෙළඳුන්ගේ ලාභ
4. ප්‍රවාහන පිරිවැය

ඒ අනුව මිල සංකල්ප තුනක් පවතී

1. මූලික මිල
2. නිෂ්පාදකයාගේ මිල
3. ගැනුම්කරුගේ මිල

**මූලික මිල (Basic Price)**


නිෂ්පාදන පිරිවැය + නිෂ්පාදකයාගේ ලාභය + නිෂ්පාදන සහනාධාර = මූලික මිල

**නිෂ්පාදකයාගේ මිල** (Producer’ s Price)

- සත්‍ය වශයෙන්ම නිෂ්පාදකයා තමන්ගේ නිමැවුම සඳහා ලබන මිල නිෂ්පාදකයාගේ මිල මගින් නිරූපණය කෙරේ. නිෂ්පාදන ස්ථානයේ සිට වෙළෙඳුන් කරා භාණ්ඩ ඉවත්ව යනවිට නිෂ්පාදකයා විසින් අයකරන මිලයි
- මෙහි නිශ්පාදන පිරිවැය, නිශ්පාදකයාගේ ලාභය සහ නිශ්පාදනය මත අයකරන බදු ඇතුළත් වන අතර නිෂ්පාදන සහනාධාර ඇතුළත් නොවේ

**ගැනුම්කරුගේ මිල/ පාරිභෝගික මිල** (Purcheser’ s Price)

- පාරිභෝගිකයා විසින් සත්‍ය වශයෙන්ම භණ්ඩය මිලදී ගන්නා විට ගෙවනමිල ගැනුම්කරුගේ මිලයි. මේ තුල වෙළඳ බදු, තොග හා සිල්ලර වෙළඳුන්ගේ ලාභ තීරුව, ප්‍රවාහන පිරිවැය ඇතුලත් වේ.


මූලික මිල, නිෂ්පාදකයාගේ මිල සහ ගැනුම්කරුගේ මිල අතර සම්බන්ධය
මූලික මිල
සහනාධාරය
නිෂ්පාදකයාගේ ලාභය
නිෂ්පාදන පිරිවැය
නිෂ්පාදකයාගේ මිල
නිෂ්පාදකයා මත බදු
නිෂ්පාදකයාගේ ලාභය
නිෂ්පාදන පිරිවැය
ගැනුම්කරුගේ මිල
වෙළෙන්දාගේ ලාභය
ගැනුම්කරුවන් මත බදු
නිෂ්පාදකයා මත බදු
නිෂ්පාදකයාගේ ලාභය
නිෂ්පාදන පිරිවැය

ජාතික ආදායම ගණනයන් ඉදිරිපත් කිරීම විවිධ ප්‍රවේශ යටතේ දක්වයි.

1. **නිමැවුම් ප්‍රවේශය (Product Approach)**

මේ යටතේ නිෂ්පාදනය සඳහා යොදාගත් දේශීය අමුද්‍රව්‍ය වල අවසාන වටිනාකම ගණනය කිරීම මඟින් ජාතික ආදායම ගණනය කිරීමයි. මෙය එකතු කළ අගය මත ජාතික ආදායම නමින් හඳුන්වයි.

2. **ආදායම් ප්‍රවේශය (Income Approach)**

මෙහිදී ප්‍රාථමික හා ද්විතීයික ආදායම් ප්‍රවාහ මත පදනම්ව ජාතික ආදායම ගණනය කරයි. මෙහිදී ඇතිවන ක්‍රියාවලිය හරහා නිර්මාණය වන ආදායම (වැටුප් හා වේතන) සහ නැවත බෙදාහැරීමේ ක්‍රියාවලියේදී මතුවන ආදායම (රාජ්‍ය බදු සහ සංක්‍රාම) වැදගත් වේ.

3. **වියදම් ප්‍රවේශය (Expenditure Approach)**


සමස්ත ආර්ථිකයේ වියදම ගනනය කරීම සිදු කරයි. වැයකළ හැකි ආදායම පරිභෝජනය හෝ ඉතුරුම් සඳහා යොදාගන්නේ කෙසේද යන්න මෙමගින් අධ්‍යයනය කරයි.

# ජාතික ආදායමේ චක්‍රීය ප්‍රවාහය (Circular flow of income)

- ආදායමේ චක්‍රිය ප්‍රවාහය මඟින් ආර්ථිකයක නිෂ්පාදන සාධක, භාණ්ඩ හා සේවා සහ මුදල් හුවමාරු වන ආකාරය පෙන්වයි. ජාතික ආදායම් ගණනය කිරීමේදී මෙම චක්‍රීය ප්‍රවාහය මත රැඳී ගණනය කිරීම් සිදු කරයි. මෙම ආදායමේ චක්‍රීය ප්‍රවාහය ආර්ථික ආකෘති කිහිපයක් යටතේ විස්තර කරයි.

**සරළ ආර්ථිකය - ද්වි ආංශික ආකෘතිය**

කුටුම්භ සහ නිෂ්පාදන (ව්‍යාපාර) ආයතන පමණක් ක්‍රියාත්මක වන ආර්ථිකයක් සරළ නැතහොත් සංවෘත ආර්ථිකයක් ලෙස හැඳින්වේ. ඒ තුළ ආදායමේ චක්‍රීය ප්‍රවාහය පහත ආකාරයට විග්‍රහ කළ හැක.




**විදීම්** (චක්‍රය තුලට එක්වන දේවල්)

I - investments - ආයෝජන

**කාන්දුවීම්** (චක්‍රයෙන් පිටතට යන දේවල්)


S – savings –ඉතුරුම්

$Y = C + I$

- මෙහිදී කුටුම්භ විසින් නිෂ්පාදන සාධක ව්‍යාපාරික අංශ වෙත සපයා ඒ සඳහා සාධක ආදායම් ලබා ගනී. එම ආදායම් ඔවුන් නැවත නිෂ්පාදන ආයතන මගින් නිෂ්පාදනය කරන නිමි භාණ්ඩ හා සේවා පරිභෝජනය සඳහා වියදම් කරයි. මේ අනුව මූල්‍ය හා මූර්ත ප්‍රවාහයන් මෙම අංශ දෙක අතර හුවමාරු වේ.

## තුන් - ආංශික ආකෘතිය (Three sector model) – Closed economy

- ද්වි ආංශික ආර්ථිකයට රජය එකතු වීමක් මෙහිදී දැකිය හැක. ද්වි අංශයේ ඇති ආර්ථික කටයුතු වලට අමතරව මෙහිදී රජය විසින් නිෂ්පාදන හා කුටුම්භ යන අංශ දෙක තුලින් ආර්ථික කටයුතු හැසිරවීම සඳහා අවශ්‍ය ආදායම් සම්පාදනය කර ගැනීම සඳහා බදු අයකරන අතර ඔවුන් දිරිමත් කිරීම සඳහා සංක්‍රාම නොහොත් ඒකපාර්ශවීය ගෙවීම් සිදුකරයි.




- Y = C + I + G

**විදීම**

I-investment, ආයෝජන


G–Govt. Expenditure – රාජ්‍ය වියදම

**කාන්දුවීම්**

S – savings- ඉතුරුම් T- tax- බදු

# සිව් - අංශික ආකෘතිය (Four sector model)

- තුන් ආංශික ආකෘතියට විදේශ අංශය එකතු වීමෙන් සිව් ආංශික ආර්ථිකය සකස් වේ.




**විදීම**

I, G,

X- export income – අපනයන ආදායම

**කාන්දුවීම්**


S, T,

M- import expenditure –ආනයන වියදම

- විදේශ අංශය තුළ විදේශ වෙළෙඳාම භාණ්ඩ හා සේවා ආනයන සහ අපනයන, ප්‍රාග්ධන ලැබීම් සහ ගෙවීම් ඇතුලත් වේ. විදේශ අංශය නිසා සංවෘත ආර්ථිකය විවෘත ආර්ථිකයක් බවට පත් වේ.
- $Y = C + I + G + (X - M)$

# පස් ආංශික ආර්ථිකය (five sector model)

- සිව් ආංශික ආර්ථිකයට මූල්‍ය අංශය එකතු වීමෙන් පස් ආංශික ආර්ථිකය සකස් වේ. මේ අනුව බැංකු, බැංකු නොවන මූල්‍ය ආයතන ආදී මූල්‍ය අතරමැදිකරණය සඳහා වූ ආනයන ඇතුළත් වේ.




| <u>**විදීම්**</u> | <u>**කාන්දුවීම්**</u> |
|---|---|
| ආයෝජන (I) | ඉතිරුම් (S) |
| රාජ්‍ය වියදම් (G) | බදු (T) |
| අපනයන (X) | ආනයන (M) |

$$Y = E$$
$$Y = C + I + G + (X-M)$$

- ජාතික ආදායම ගණනය කිරීම ක්‍රම දෙකක් යටතේ සිදුකරයි. එනම් නාමික අගය ගණනය කිරීම සහ මූර්ත අගය ගණනය කිරීමයි. නාමික අගය පවතින වෙළෙඳපොළ මිල යටතේ ගණනය කරන අතර මූර්ත අගය කාලයත් සමඟ මිලෙහි සිදුවන වෙනස්වීම් ගැලපීමෙන් සිදුකිරීමෙනි (ස්ථාවර මිල). ස්ථාවර මිල යටතේ කරන ගණනයන් වලින් සැබෑ වටිනාකම සොයාගත හැක

නිෂ්පාදන ප්‍රවේශය

- කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (පවත්නා වෙළඳපොළ මිල අනුව)
- කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව)

වියදම් ප්‍රවේශය

- පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම
- 2010 ස්ථාවර මිල අනුව සමස්ත ඉල්ලුම

ආදායම් ප්‍රවේශය

- පවත්නා වෙළඳපොළ මිල යටතේ ආදායම් සංරචක
- 2010 ස්ථාවර මිල අනුව ආදායම් සංරචක

මූර්ත ජාතික නිෂ්පාදිතය = පවතින මිල යටතේ ජාතික නිෂ්පාදිතය * 100

ගම්‍ය මිල දර්ශකය

ගම්‍ය මිල දර්ශකය = පවතින මිල යටතේ ජාතික නිෂ්පාදිතය * 100

ස්ථාවර මිල යටතේ ජාතික නිෂ්පාදිතය

## **ආර්ථික වර්ධනය සහ ආර්ථික වර්ධන අනුපාතය** (Economic Growth and Economic Growth Rate)

- දීර්ඝ කාලයක් තිස්සේ ස්ථාවර දළ ජාතික නිෂ්පාදිතයේ අඛණ්ඩ වැඩිවීම (වර්ධනය) ආර්ථික වර්ධනය වන අතර වර්ෂයට දෙකක ආර්ථික වර්ධනයේ සාපේක්ෂ වෙනස ප්‍රතිශතාත්මකව දැක්වීම ආර්ථික වර්ධන අනුපාතය **වේ**

## නිමැවුම් ප්‍රවේශය

1. අවසාන නිෂ්පාදිත ක්‍රමය (Final Output Method)
2. එකතුකළ වටිනාකම් ක්‍රමය (Value Added Method)

## අවසාන නිෂ්පාදිත ක්‍රමය

- නිෂ්පාදන ක්‍රියාවලියේ අවසාන අවස්ථාව පසුකල පසු, එනම් තවදුරටත් සකස් කිරීමකින් තොරව පරිභෝජනය හෝ ආයෝජනය කල හැකි භාණ්ඩ හා සේවා පමණක් ජාතික ගිණුම් වලට ඇතුලත් කරගැනීම මේ යටතට අයත් වේ.

## එකතු කළ වටිනාකම් ක්‍රමය

- එකතු කළ අගය පිළිබඳ සංකල්පය නිෂ්පාදනයේ එක් එක් අදියරේදී අවසන් නිෂ්පාදනයේ අගයට අලුතින් එකතු වන නිශ්චිත ප්‍රමාණය පමණක් ජාතික ගිණුම්ගත කිරීමයි.

**එකතු කළ අගය = සමස්ත නිෂ්පාදනයේ වටිනාකම - අමුද්‍රව්‍ය සහ අතරමැදි නිෂ්පාදන සඳහා දරන මුළු වියදම**

උදා:

| භාණ්ඩ | නිෂ්පාදනය කරන ලද | මිලදී ගන්නා ලද | මිල | එකතු කරන ලද අගය |
|---|---|---|---|---|
| දැව | දැව කපන්නා | ලී මෝල් කරුවා | Rs. 12000 | Rs 12000 |
| සකසන ලද දැව | ලී මෝල් කරුවා | ඉදිකිරීම් සමාගම | Rs. 25000 | Rs. 13000 |
| නිවස | ඉදිකිරීම් සමාගම | කුටුම්බය | Rs. 125000 | Rs. 100000 |
| | | අවසාන වටිනාකම | **Rs. 125000** | |
| | | එකතු කළ වටිනාකම් එකතුව | | **Rs. 125000** |

# නිමැවුම් ප්‍රවේශය

**කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය(පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)**

රුපියල් මිලියන

| ආර්ථික කටයුතු | 2019 වාර්ෂික (ඇ) | 2020 කාර්තුව 1 (ඇ) |
|---|---|---|
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | 1,113,834 | 282,411 |
| **කර්මාන්ත** | 4,114,102 | 1,092,139 |
| **සේවා** | 8,744,656 | 2,242,027 |
| **මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය** | 13,972,591 | 3,616,577 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර | 1,043,551 | 229,323 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය(ද.දේ.නි.)** | 15,016,142 | 3,845,900 |

(අ ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

ංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(ආ) සංශෝධිත

(ඇ ) තාවකාලික

| කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය |
| --- |
| ධාන්‍ය වගාව (වී හැර) |
| වී වගාව |
| එළවළු වගාව |
| උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග |
| පළතුරු වගාව |
| තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) |
| තේ වගාව |
| වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී.) |
| කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව |
| රබර් වගාව |
| වෙනත් බහුවාර්ෂික භෝග වගාව |
| කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ව නිෂ්පාදනයන් |
| පැල බෝකිරීම |
| කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් |
| වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන |
| කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව |
| මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව |

| කර්මාන්ත |
| --- |
| පතල් හා කැණීම් කර්මාන්තය |
| ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය |
| රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ හා බුමුතුරුණු නිෂ්පාදනය |
| ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන |
| කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය |
| අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන |
| රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන |
| ලෝහමය නොවන වෙනත් ඛණිජ නිෂ්පාදන |
| ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන |
| යන්ත්‍රෝපකරණ නිෂ්පාදන |
| ගෘහ භාණ්ඩ නිෂ්පාදනය |
| වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම |
| විදුලිය නිෂ්පාදනය |
| ජලය පිරිසිදුකිරිම සහ බෙදාහැරීම |
| මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රියකරණය |
| ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් |

| සේවා |
| --- |
| තොග හා සිල්ලර වෙළඳාම |
| මගින් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම (ගොඩබිම, ජලය සහ ගුවන්) |
| තැපැල් සහ කුරියර් සේවාවන් |
| නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් |
| ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු |
| විදුලි සංදේශ සේවාවන් |
| පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවන් |
| මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවාවන් සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවන් |
| රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය |
| නිවාස අයිතිය සහ දේපොළ වෙළඳාම |
| වෘත්තියමය සේවාවන් |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය |
| අධ්‍යාපනය |
| සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් |
| වෙනත් පෞද්ගලික සේවාවන් |

# ආදායම් ප්‍රවේශය

**පවත්නා වෙළඳපොළ මිල යටතේ ආදායම් සංරචක(අ)**

රුපියල් මිලියන

| අයිතමය | 2019 වාර්ෂික (ඇ) |
|---|---|
| 1. සේවක ආදායම | 4,436,789 |
| 2. දළ මෙහෙයුම් අතිරික්තය | 9,476,074 |
| 3. නිෂ්පාදනය මත වූ සහනාධාර අඩු කරන ලද වෙනත් බදු | 59,728 |
| **4. මූලික මිල යටතේ දළ එකතු කළ වටිනාකම** | **13,972,591** |
| (+) භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර | 1,043,551 |
| **5. වෙළඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය** | **15,016,142** |

(අ ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(ආ) සංශෝධිත

(ඇ ) තාවකාලික

**සේවක ආදායම (Labour Income)**

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ශ්‍රමය ලබා දීමෙන් සේවකයින් උපයන ආදායම ඒ තුළ පහත සඳහන් දේ ඇතුළත් වේ

**මූල්‍ය දීමනාව (Financial allowance)**

වැටුප් සහ වැටුප් නවාතැන් දීමනාව, ගමන් වියදම්, ආපදා දීමනාව

වන්දි

**ද්‍රව්‍යමය දීමනාව දීමනාව (in-kind allowance)**

ආහාර, සෞඛ්‍ය පහසුකම්, ප්‍රවාහන සේවා

සේවා යෝජකයා විසින් සපයනු ලබන සමාජ ආරක්ෂණ ගෙවීම් අර්ථසාධක අරමුදල, විශ්‍රාම යෝජනා ක්‍රමය, සහ රක්ෂණ සේවා.

## දළ මෙහෙයුම් අතිරික්තය (Gross Operational surplus)

- ප්‍රාග්ධන සාධකය මගින් උපයන සංස්ථාපිත ව්‍යවසායන් විසින් නිෂ්පාදනයෙන් ලබා ගන්නා ආදායමේ කොටස වේ. එය ජාතික ගිණුම්වල ආදායම් ගිණුම උත්පාදනය කිරීමේදී සමතුලිත අයිතමයක් ලෙස ගණනය කෙරේ

## මිශ්‍ර ආදායම (Mixed Income)

- සංස්ථාපිත නොවන ව්‍යවසායන් සඳහා (උදාඃ ගොවිපලවල් සහ සිල්ලර වෙළඳසැල් වැනි කුඩා පවුල් ව්‍යාපාර හෝ ස්වයං රැකියා කුලී රථ රියදුරන්, නීතිඥයින් සහ සෞඛ්‍ය වෘත්තිකයන්) ඉහත සංකල්පය දළ මිශ්‍ර ආදායම ලෙස හඳුන්වයි. සංස්ථාපිත නොවන ව්‍යවසායන් තුල බොහෝ අවස්ථාවන්හිදී ශ්‍රමයෙන් ලැබෙන ආදායම සහ ප්‍රාග්ධනයෙන් ලැබෙන ආදායම අතර වෙනස හඳුනාගැනීම අපහසු බැවින්, නිෂ්පාදනයේදී භාවිතා වන ප්‍රාග්ධනයේ සහ ශ්‍රමයේ (පවුලේ සාමාජිකයන්ගේ සහ තමාගේ) යන දෙකෙහිම ආදායම ගිණුමේ ”මිශ්‍ර” ලෙස ඇතුළත් කරයි.

# වියදම් ප්‍රවේශය

**පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම (අ)**

රුපියල් මිලියන

| අයිතමය | 2020 වාර්ෂික (ඇ) | 2021 කාර්තුව 1 (ආ)(ඇ) | 2021 කාර්තුව 2 (ආ)(ඇ) | 2021 කාර්තුව 3 (ඇ) |
|---|---|---|---|---|
| **අ. දේශීය ඉල්ලුම** | | | | |
| පරිභෝජනය | 12,146,234 | 3,789,311 | 2,825,427 | 3,593,319 |
| පෞද්ගලික පරිභෝජනය | 10,589,745 | 3,431,027 | 2,396,394 | 3,186,039 |
| රාජ්‍ය පරිභෝජනය | 1,556,489 | 358,284 | 429,033 | 407,280 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 3,778,482 | 737,003 | 1,195,466 | 814,999 |
| දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 3,809,794 | 1,088,136 | 1,103,932 | 1,106,909 |
| තොග/පරිලේඛන වෙනස්වීම් සහ වටිනාදේ අත්පත් කරගැනීම් සහ අතහ | -31,312 | -351,133 | 91,534 | -291,910 |
| සමස්ත දේශීය ඉල්ලුම | 15,924,716 | 4,526,314 | 4,020,893 | 4,408,317 |
| **ආ. විදේශීය ඉල්ලුම** | | | | |
| ශුද්ධ විදේශීය ඉල්ලුම | -951,721 | -346,969 | -389,538 | -275,363 |
| භාණ්ඩ හා සේවා අපනයන | 2,483,056 | 695,906 | 658,716 | 777,121 |
| භාණ්ඩ හා සේවා ආනයන | 3,434,777 | 1,042,875 | 1,048,254 | 1,052,484 |
| **ඇ. සමස්ත ඉල්ලුම** | **14,972,995** | **4,179,345** | **3,631,355** | **4,132,955** |

(අ ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ආ) සංශෝධිත

(ඇ ) තාවකාලික

*මූලයන්:* ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ස්තූතියි!